සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved



10 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2019 | 33 S I

## ඉතිහාසය - I

කාලය පැය එකයි

සැලකිය යුතුයි :- ● සියළුම ප්‍රශ්ණ වලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 80ක් හිමි වේ.
● අංක I සිට 40 දක්වා ප්‍රශ්ණවල දී ඇති (1) , (2), (3), (4) පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න.
● ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්ණය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුල ( x ) ලකුණ යොදන්න.

(01). පාලි භාෂාවෙන් රචිත එම කෘතියේ ඇතැම් තැන් තවත් විස්තර කොට අර්ථ විවරණය කිරීම සඳහා සම්පාදිත ග්‍රන්ථය වන්නේ,
( i ) සාරාර්ථ සංග්‍රහයයි. ( ii ) වංසත්තපකාසිනියයි. ( iii ) සද්ධර්මාලංකාරයයි. ( iv ) දීප වංශයයි.

(02). ''නානක'' මූලාශ්‍රයකට උදාහරණයක් වන්නේ,
(i) ඇම්බැක්කේ ලී කැටයම් ය. (ii) "අක"නම් රන් කාසිය.
(iii) පනාකඩුව තඹ සන්නස ය. (iv) වේගිරිය සෙල්ලිපිය.

(03). තමන් විසින් නොදුටු, එහෙත් වෙනත් අය විසින් පවසන ලද තොරතුරු මත පිහිටා ශ්‍රී ලංකාව පිළිබඳ වාර්තා තැබූ මූලාශ්‍රයක් නොවන්නේ මින් කුමක්ද?
( i ) නැචුරාලිස් හිස්ටෝරියා කෘතියයි. ( ii ) ඩිමුන්ඩෝ කෘතියයි.
( iii) ඉන්ඩිකා කෘතියයි. ( iv ) එදා හෙළ දිව කෘතියයි.

(04). ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික ස්ථානවල ව්‍යාප්තිය අනුව වැඩිම ජනාවාස සංඛ්‍යාවක් ව්‍යාප්තව පැවති පරිසර කලාපය කුමක්ද?
( i ) A- අර්ධ ශුෂ්ක කලාපය ( ii ) B - පහතරට වියලි කලාපය
( iii) C- පහතරට අතරමැදි වියලි කලාපය ( iv ) D - තෙත් කලාපය

(05). a) යකඩ ලෝහ භාවිතය. b) මහා ශිලා සුසාන සම්ප්‍රදාය e) වාරි තාක්ෂණය.
c) වාපි ගම් බිහිවීම. d) ස්ථිර වාසිතාවය.
ඉහත තොරතුරු අනුව පූර්ව ඓතිහාසික යුගයට අයත් නොවන පිළිතුරු යුගලය වන්නේ?
i ) a හා b ය. ii ) b හා c ය. iii ) c හා e ය. iv ) c හා d ය.

(06). ''අතීතයේ වගාකල කන්න තුනක් '' පිළිබඳව තොරතුරු සඳහන් මූලාශ්‍රය /සෙල්ලිපිය වන්නේ,
( i ) කළු දිය පොකුණු සෙල්ලිපියයි. ( ii ) අඹගමුව සෙල්ලිපියයි.
( iii) තෝනිගල සෙල්ලිපියයි. ( iv ) හෝපිටිගමුව ටැම් ලිපියයි.

(07). ''කැළෑ දෙල් ඇට පුළුස්සා ආහාරයට ගැනීම'' ආහාර සඳහා ලුණු භාවිතා කිරීම" යන සාක්ෂි හමු වූ ප්‍රාග් ඓතිහාසික ස්ථානය කුමක්ද?
( i ) බෙල්ලන් බැඳි පැලැස්ස ය. ( ii ) කිතුල් ගල බෙලි ලෙන ය.
( iii) අත්තනගොඩ අළුලෙන ය. ( iv ) කුරුවිට බටදොඹලෙන ය.

(08). මුල් ඓතිහාසික යුගයේ ජනාවාස ව්‍යාප්තව පැවැති ප්‍රදේශ පෙන්නුම් කරන ප්‍රධාන දර්ශකය වන්නේ,
( i ) කුඩා වැව් වල ව්‍යාප්තියයි. ( ii ) මහ වැව්වල ව්‍යාප්තියයි.
( iii) උඩ රංචා මඩම නිවසයි. (iv) ගල්ලෙන් වලින් ලද සාක්ෂියයි.

(09). පහත සඳහන් සෙල්ලිපි හා සම්බන්ධ තොරතුරු නිවැරදිව ගැලපූ විට ලැබෙන පිළිතුර වන්නේ,

| | |
|---|---|
| ( i ) මැදිරිගිරිය සෙල්ලිපිය | A එක්තැන් සම්ය පිළිබඳ සඳහන් වේ. |
| ( ii ) බුද්ධන්නේහෙල සෙල්ලිපිය | B දසගම් ඇත්තන් පිළිබඳ සඳහන් වේ. |
| ( iii) කළුදිය පොකුණ සෙල්ලිපිය | C සභාව පිළිබඳ සඳහන් වේ. |
| ( iv ) කෙරලෑගම ඉඩමේ සෙල්ලිපිය | D මහලේ කස්බා පිළිබඳ සඳහන් වේ. |

( i ) B, C, A, D ය ( ii ) A, B, D, C, ය ( iii ) D, A, B, C, ය ( iv ) D, C, A, B ය

(10). පැරණි ලංකාවේ හේන් වගාව සම්බන්ධයෙන් පහත දී ඇති ප්‍රකාශ වලින් නොගැලපෙන ප්‍රකාශය තෝරන්න.
( i ) අලුතින් ගිණි තබා සකස් කර ගත් හේන, නව දැලි හේන නම් වේ.
( ii ) සද්ධර්මරත්නාවලියේ ''හේන'' හඳුන්වා ඇත්තේ '' නව දැලි සේන'' ලෙසය
( iii) කලක් අතහැර දමා යලිත් වගාව අරඹන ලද හේන ''කනත්ත'' නම් වේ.
( iv ) කාලයක් තිස්සේ අතහැර දමා යලි වගාව සඳහා භාවිතා නොකරන ලද ඉඩම '' කනත්ත'' නම් වේ.

(11). පුරාණයේ මෙරට "ඇත් දත්" කැටයම් කර්මාන්තයක් ලෙස පැවැති බව සඳහන් සෙල්ලිපිය වන්නේ,
( i ) වේගිරිය සෙල්ලිපිය යි. ( ii ) හබැස්ස සෙල්ලිපිය යි.
( iii) බදුලු ටැම්ලිපිය යි. ( iv ) ගඩලාදෙණිය පර්වත ලිපිය යි.

(12). බෞද්ධ විහාර ආරාමවල නායක ස්වාමීන් වහන්සේලා යටතේ වැඩ වාසය කළ භික්ෂූන් වහන්සේලා හැඳින්වූයේ,
( i ) ථෙර නමිනි. ( ii ) සද්ධි විහරිය නමිනි.
( iii) අන්තේවාසික නමිනි. ( iv ) සාමනේර නමිනි.

(13). අනුරාධපුර යුගයේ පැවැති ප්‍රධාන ආගමික හා අධ්‍යාපන මධ්‍යස්ථාන දෙක වූයේ
( i ) මහ විහාරය හා ලෝවාමහා පායය ය. ( ii ) අභයගිරිය හා මහා විහාරය ය.
( iii) අභයගිරිය හා ථූපාරාමය ය. ( iv ) මහා විහාරය හා ථූපාරාමය ය.

(14). පහත ප්‍රකාශ සලකන්න.
a - ප්‍රථමවරට ගංගාවක් හරස් කොට අමුණක් ඉදිකල රජතුමා
b - ප්‍රථම වරට මුළු දිවයිනම එක්සෙසත් කල රජතුමා
c - ප්‍රථමවර රජරට ප්‍රදේශය එක්සෙසත් කල රජතුමා
d - මහවැව් නිර්මාණය කිරිමේ ආරම්භක රජතුමා
ඉහත ප්‍රකාශ හා සම්බන්ධ රජවරුන් පිළිවෙලින් නම් කල විට ලැබෙන පිළිතුර වන්නේ,
( i ) පණ්ඩුකාභය, දුටුගැමුණු, ඉලනාග, වසභ යන රජවරුන් ය.
( ii ) වසභ, දුටුගැමුණු, ඉලනාග, පණ්ඩුකාභය යන රජවරුන් ය.
( iii) ඉලනාග, දුටුගැමුණු, පණ්ඩුකාභය, වසභ යන රජවරුන් ය.
( iv ) දුටුගැමුණු, පණ්ඩුකාභය, වසභ, ඉලනාග යන රජවරුන් ය.

(15). I වන පරාක්‍රමබාහු රජු උපන් ස්ථානයේ තැනවූ චෛත්‍ය වන්නේ,
( i ) අභයගිරි චෛත්‍යයයි. ( ii ) ථූපාරාමය.
( iii) ගිරිගඩු සෑය. ( iv ) දැදිගම සූතිඝර චෛත්‍යයයි.

(16). වෙර යොදා බලයක් යෙදීමෙන් ගල්පතුරු ගලවා ගැනීමේ තාක්ෂණය හඳුන්වන්නේ,
( i ) පීඩන ශල්කන තාක්ෂණය ලෙසය. ( ii ) වජ්‍ර චුම්භට තාක්ෂණය ලෙසය.
( iii) අධිපීඩන තාක්ෂණය ලෙසය. ( iv ) අව පීඩන තාක්ෂණය ලෙසය.

(17). පැරණි ලංකාවේ පැවැති මිනුම් ක්‍රම සම්බන්ධයෙන් පහත සඳහන් ''අ'' හා ''ආ'' තීරුවල කිසියම් සබඳතාවක් ඇත. ඒවා නිවැරදිව ගැලපූ විට ලැබෙන පිළිතුරු වන්නේ,
( i ) අමුණ - A බර මැණීම
( ii ) පරමාණුව - B අවකාශය මැනීම
( iii) ගුන්ජා - C කාලය මැනීම
( iv ) තත - D දිග මැනීම

( i ) C, A,B හා D ය. ( ii ) A,C,D හා B ය. ( iii ) B,D,C හා A ය. ( vi ) B,D,A හා C ය.

(18). පැරැණ්නන් තුළ අපද්‍රව්‍ය කළමණාකරණය පිළිබඳ මනා දැනුමක් පැවති බවට තොරතුරු හෙළිවන්නේ,
( i ) අනුරාධපුර අභයගිරි විහාර භූමියෙනි. ( ii ) පොළොන්නරුව -ආලාහන පිරිවෙනෙනි.
( iii) අනුරාධපුර - මහා විහාර භූමියෙනි. ( iv ) පොළොන්නරු - පරාක්‍රමබාහු රජ මාලිගයෙනි.

(19). දැදිගම ඇත් පහනේ ඇති විද්‍යාත්මක මූලධර්මය වන්නේ,
( i ) ස්ථිතික ජල විද්‍යාත්මක මූලධර්මයයි. ( ii ) වජ්‍ර චුම්භට න්‍යායයි.
( iii) ගතික ජල විද්‍යාත්මක මූලධර්මයයි. ( iv ) අවලම්භන න්‍යායයි.

(20). පහත වගුවේ A සිට I දක්වා දී ඇති තොරතුරු අධ්‍යනය කර අසා ඇති ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

| | | |
|---|---|---|
| A. බුද්ධරාජ විසින් දණ්ඩ නායක තනතුරක් දැරීම. | D දඹුළු විහාර සෙල්ලිපිය. | G රාජ්‍යත්ව සංකල්පය පිළිබඳව සඳහන්වීම. |
| B. පරුමුඛවරුන් පාලනයට සම්බන්ධ කරගැනීම. | E පනාකඩුව තඹ සන්නස. | H ප්‍රථම සංවිධානාත්මක සටන් ව්‍යාපාර මෙහෙයවීම. |
| C. රජු නරඉසෙර ලෙස හඳුන්වා තිබීම. | F මාතතොට අන්තර්ජාතික වරායේ බලය රැකගැනීම. | I අන්තර්ජාතික කලාපීය අවශ්‍යතාවයන්ට අනුව රාජධානිය මාරුකිරීම. |

(20). I වන විජයබාහු රජු පිළිබඳ තොරතුරු ඇතුළත් පිළිතුර කුමක්ද?
( i ) C,E හා G ය. ( ii ) A,E හා I ය. ( iii) B,F හා H ය. ( iv ) A,D හා I ය.

(21). '' දරුවන් නැති ජීවිතය කුමන සැපැක්දැයි '' පැවසූ රාජ කුල කාන්තාව කවුද?
( i ) අශෝක මාලාය. ( ii ) කල්‍යාණවතී බිසවය.
( iii) ලීලාවතී බිසවය. ( iv ) විහාර මහා දේවියය.

(22). මෙරට කාසි භාවිතය ආරම්භ වන්නේ,
( i ) ක්‍රි.පූ. 250 දීය. ( ii ) ක්‍රි.ව. 250 දීය. (iii) ක්‍රි.පු. 450 දීය. ( iv ) ක්‍රි.ව. 1 දීය.

(23). '' ආක්‍රමණිකයෝ ...... මිනිසුන් බැඳ දමා වදකොට ධනය පැහැරගෙන දිළින්දන් කලහ. දරුවන්ට තැළුහ. උපාසකයන්ට පහර දුන්හ'' යනුවෙන් වංශකථාහි සඳහන් ආක්‍රමණය හා යුගය නිවැරදිව දක්වන පිළිතුර කුමක්ද?
( i ) චන්ද්‍රභානුගේ I වන ආක්‍රමණය - දඹදෙණි යුගය
( ii ) චෝල ආක්‍රමණය - අනුරාධපුර යුගය
( iii) කාලිංග මාඝ ආක්‍රමණය - පොළොන්නරු යුගය
( iv ) ආර්යය චක්‍රවර්ති ආක්‍රමණය - ගම්පොල යුගය

(24). පහත සඳහන් තොරතුරු ඇසුරින් නිශ්ශංක මල්ල රජුට පමණක් අදාළ පිළිතුර තෝරන්න.
A - අඹගමුව සෙල්ලිපිය.
B - රජරට ප්‍රදේශය එක්සත් කිරීම.
C - කාලිංස චක්‍රවර්ති නාමයෙන් හැඳින්වීම.
D - ගල්පොත ශිලා ලිපිය ලිවීම.
( i ) A හා B ය. ( ii ) B හා C ය. ( iii ) C හා D ය. ( ii ) A හා D ය.

(25). මෙරට සිංහල රාජ වංශයේ අවසාන පාලකයා හා නායක්කාර් වංශයේ ආරම්භක පාලකයා පිළිවෙළින් දැක්වෙන පිළිතුර කුමක්ද?
( i ) ශ්‍රී වික්‍රම රාජසිංහ රජු හා ශ්‍රී විජය රාජසිංහ රජුය.
( ii ) ශ්‍රී විජය රාජසිංහ රජු හා වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු.
( iii) ශ්‍රී විජය රාජසිංහ - කීර්ති ශ්‍රී රාජසිංහ.
( iv ) ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ හා ශ්‍රී විජය රාජසිංහ.

(26). උඩරට රාජධානියේ සිටි රජතුමා විසින් විසඳන ලද නඩු වර්ගයක් නොවන්නේ,
( i ) කැරලි කෝලහාල සම්බන්ධ නඩු. ( ii ) කුමන්ත්‍රණ සම්බන්ධ නඩු.
( iii) පවුල් ආරවුල් සම්බන්ධ නඩු. ( iv ) රාජ්‍ය ප්‍රතිපත්ති සම්බන්ධ නඩු.

(27). පාණ්ඩ්‍ය වංශකයන් විසින් තුන්වතාවක් මෙරට රජකරවූ රැජිණිය කවුද?
( i ) සුගලා බිසවය. ( ii ) ලීලාවතී බිසවය. ( iii) කල්‍යාණවතී බිසවය. ( iv ) චූලසීවලී දේවිය.

28). පහත සිදුවීම් අතරින් ගම්පල රාජධානි සමයේ ලංකාවට පැමිණි සංචාරකයෙකුට අසන්නට හෝ දකින්නට නොලැබෙන සිදුවීම් ඇතුළත් පිළිතුර කුමක්ද?
A - පැපිලියානේ සුනේත්‍රා දේවි පිරිවෙන කරවීම. B - ගඩලාදෙණි විහාරය කරවීම.
C - ජෝතිය සිටාණන්ගේ උඩරට කැරැල්ල. D - සිංහල පෙරළිය හෙවත් සිංහල සංගය ඇතිවීම.
( i ) A හා D ය . ( ii ) B හා C ය. ( ii ) C හා D ය. ( ii ) B හා D ය.

(29). කෝට්ටේ යුගයට අයත් සාහිත්‍ය ග්‍රන්ථ පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
( i ) පරවි සංදේශය, ගිරා සංදේශය , තිසර සංදේශය හා ගුත්තිල කාව්‍යය ය.
( ii ) බුදුගුණ අලංකාරය, කාව්‍යශේකරය, පැරකුම් සිරිත හා මයුර සංදේශය ය.
( iii) මයුර සංදේශය, ගුත්තිල කාව්‍ය, පරවි සංදේශය හා කාව්‍ය ශේඛරය ය.
( iv ) පරවි සංදේශය, ගිරා සංදේශය, පැරකුම්බා සිරිත හා ගුත්තිල කාව්‍ය ය.

(30). මෙරටට මුද්‍රණ යන්ත්‍රය හඳුන්වා දුන් යුරෝපා ජාතිකයන් කවුද?
( i ) පෘතුගීසින් ය. ( ii ) ලන්දේසී ය. (iii) ඉංග්‍රීසීන් ය. (iv ) ප්‍රංශ ජාතිකයින් ය.

(31). තමා මෙරටට පැමිණෙන විට ගෙන ආ පුද පඬුරු දෙවුන්දර දේවාලකට පූජා කර ත්‍රෛයි භාෂා සෙල් ලිපියක් ලියාතබා ගිය විදේශිකයා කවුද?
( i ) ඉබන් බතූතා ය. ( ii ) අල්බල්සූරිය ය. (iii) චෙංහෝ සෙන්පතියා ය. (iv ) අරිය චක්‍රවර්ති ය.

(32). '' ක්‍රිස්තුන් වහන්සේගේ අන්තිම රාත්‍රී භෝජන සංග්‍රහය'' චිත්‍රය නිර්මාණය කරනු ලැබුවේ,
( i ) ලියනාඩෝ ඩාවින්චි ය. ( ii ) රෆායල් ය. (iii) බොට්ටි චෙල්ලි ය. ( iv ) ඉරාස්මස් ය.

(33). '' අත්හදා බැලීමේ පියා'' යන විරුද නාමයෙන් හඳුන්වනු ලැබූ විද්‍යාඥයා කවුද?
( i ) අයිසැක් නිව්ටන් ය. ( ii ) ජොහැන්ස් කෙප්ලර් ය.
( iii) මයිකල් සර්ටෙස් ය. ( iv ) ගැලීලියෝ ගැලිලි ය.

(34). දේශගවේශණ ව්‍යාපාරය හා සම්බන්ධ පහත සඳහන් තොරතුරු වල සම්බන්ධය අධ්‍යයනය කර නිවැරදි පිළිතුර තෝරන්න.

| | |
|---|---|
| ( i ) ක්‍රිස්ටෝපර් කොලම්බස් | A ඇමරිකාව |
| ( ii ) ඇමරිගෝ වෙස්පුෂි | B කැනඩාව |
| ( iii) බර්තතෝලමියුඩයස් | C බටහිර ඉන්දීය දූපත් |
| ( iv ) කැබේ සහෝදරයෝ | D කුණාටු තුඩුව |

( i ) DBAC ය. ( ii ) CADB ය. ( iii ) CDAB ය. ( iv ) BCAD ය.

- **පහත A, B, C හා D පද යුගල අධ්‍යනය කර 35, 36, ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**

A - 1. වැඩවසම් ක්‍රමයේ බිඳ වැටීම.
2. පුනරුදය
B - 1. ජාතික රාජ්‍ය බිහි වීම
2. දේවවරම් වාදය බලවත් වීම.
C - 1. වෙළඳාම දියුණු වීම
2. ග්‍රීක ලතින් භාෂා වලට නව පණක් ලැබීම.
D - 1. ආගමික ප්‍රතිසංස්කරණ
2. ප්‍රති රෙපරමාදු ව්‍යාපාරය.

(35). පළමුවැන්නේ දුර්වලතාවය දෙවැන්න ඇති වීමට හේතුවිය.
( i ) A ය. ( ii ) B ය. ( iii ) C ය. ( iv ) D ය.

(36). ඉහත ප්‍රකාශ අතර කිසිම සබඳතාවක් නොපෙන්වන අදහස් යුගලය වන්නේ,
( i ) A ය. ( ii ) B ය. ( iii ) C ය. ( iv ) D ය.

(37). ශ්‍රී ලංකාව පිළිබඳ තොරතුරු සඳහන් වන ඉන්දියානු වෙළඳ සංගමයක් නොවන්නේ පහත මූලාශ්‍ර ඇසුරින් කවරක්ද ?
( i ) නානාදේසි ය. ( ii ) වලඤ්ඤියාර් ය.
( iii) අයිනුර්වරු ය. ( iv ) පදිර්රුපත්තු ය.

(38). අම්බුළුගල කුමරු කෝට්ටේ රාජධානියේ රාජ්‍යත්වයට පත්වන්නේ කීවන පරාක්‍රමබාහු නමින්ද?
( i ) III වන පරාක්‍රමබාහු ලෙසයි. ( ii ) IV වන පරාක්‍රම බාහු ලෙසය.
( iii) V මහා පරාක්‍රම බාහු ලෙසය. ( iv ) VIII වන පරාක්‍රමබාහු ලෙසය.

(39). පෘතුගීසින් විසින් කුසුමාසන දේවිය උඩරට රජු ලෙස පත් කරන්නේ කුමන සටන මඟින්ද?
( i ) දන්තුරේ සටන මඟිනි. ( ii ) බලන සටන මඟිනි.
( iii) රන්දෙණිවෙල සටන මඟිනි. ( iv ) ගන්නෝරුව සටන මඟිනි.

(40). පෘතුගීසින් මෙරටට ගොඩබසින ලද වර්ෂය වන්නේ,
( i ) ක්‍රි.ව. 1505 දීය ( ii ) ක්‍රි.ව. 1602 දීය
( iii) ක්‍රි.ව. 1594 දීය ( iv ) ක්‍රි.ව. 1638 දීය

සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

**10 ශ්‍රේණිය** වර්ෂ අවසාන පරීක්ෂණය - 2019 **33 S I**

**ඉතිහාසය - II** **කාලය පැය තුනයි**

**සැලකිය යුතුයි :-**
- **I කොටසේ (I) ප්‍රශ්ණය අනිවාර්යය වේ.**
- **II කොටසින් ප්‍රශ්න හතරකටද , III කොටසින් ප්‍රශ්න I කටද පිළිතුරු සපයන්න.**

පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න ගණන හයකි.

I - කොටස

(01). (අ) පහත (i) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන **සියල්ලම** සපයා ඇති ශ්‍රී ලංකා සිතියමේද (ii) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන **සියල්ලම** සපයා ඇති ලෝක සිතියම් කොටසේද ලකුණු කර නම් කරන්න.

( i ) සීගිරි පොතාන, ඉරණමඩු වැව, මාගම, සෙංකඩගල, කෝට්ටේ, දඹකොළ පටුන, මඩකලපුව මල්වතු ඔය, මහාතිත්ථ පොළොන්නරුව, හැමන්හෙල්, කල්පිටිය. (ලකුණු 12)

( ii ) කැලිකට්, කොන්ස්තන්තිනෝපල්, රෝමය, බ්‍රිතාන්‍ය, පර්සියන් බොක්ක, මලක්කා සමුද්‍රසන්ධිය. (ලකුණු06)

(ආ) පහත A,B,C හා D හා යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරු හා සම්බන්ධ පුද්ගලයින්ගේ නම් පිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

( i ) A - ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීමේ දී මෙරට පාලනය කළ රජතුමා -

B - පෙරදිග පෘතුගීසි ප්‍රතිරාජ්‍යා ලෙස මෙරටට පත්කොට එවූ පුද්ගලයා

C - යාපන රාජධානියේ ආරම්භක පාලකයා -

D - ''රතු කැට දිවයින'' ලෙස මෙරට නම් කරන ලද විදේශිකයා - (ලකුණු 04)

( ii ) පහත A හා B, C හා D යටතේ දක්වා ඇති පිංතූර අධ්‍යනය කොට අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.



A රූපය

( i ) මෙම පිංතූරයෙන් දැක්වෙන පුද්ගලයා කවුද?

( ii ) මොහු විසින් සිදුකළ වැදගත් සේවාව කුමක්ද?

( iii ) මොහු කුමන ජාතිකයෙක්ද?

( iv ) මෙතුමා විසින් ලියන ලද ඓතිහාසික ග්‍රන්ථයක් නම් කරන්න. (ලකුණු 04)



B රූපය

( iii ) ( i ) මෙම රූපයෙන් දැක්වෙන්නේ කුමක්ද?

( ii ) මෙය සොයාගත් පිහිටි ස්ථානය නම් කරන්න.

( iii ) මෙම නිර්මාණය කුමන යුගයකට අයත්ද?

( iv ) මෙය නිෂ්පාදනය කිරීම සඳහා භාවිතා කළ උපකරණය නම් කරන්න. (ලකුණු 04)

## II - කොටස

(02). ( i ) පහත a, b හා c යටතේ අසා ඇති ප්‍රශ්න සඳහා උදාහරණය බැගින් ඉදිරියෙන් ලියන්න.

a - නානක මූලාශ්‍රයකට උදාහරණයක් - b - අභිලේඛනයකට උදාහරණයක් -

c - ආගමික නොවන නටඹුන් සඳහා උදාහරණයක් බැගින් ලියන්න. (ලකුණු 03)

( ii ) ඉතිහාසය ඉගෙනීමෙන් ලැබෙන ප්‍රයෝජන හතරක් ලියන්න. (ලකුණු 04)

( iii ) සාහිත්‍ය මූලාශ්‍රයකින් තොරතුරු ලබා ගැනීමේදී අප සැලකිලිමත් විය යුත්තේ ඇයි? කරුණු දෙකක් මඟින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

( iv ) රටක ඉතිහාසය ගොඩනැගීමේදි විදේශ මූලාශ්‍ර වැදගත් වන්නේ ඇයිදැයි කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(03). ( i ) a. ශ්‍රී ලංකාව ජනාවාස කරන ලැදැයි සැලකෙන මුල්ම මානවයා කවුද? (ලකුණු 01)

b. මෙරට ප්‍රාග් ඓතිහාසික මානවයා ජීවත් වුවා යැයි සැලකෙන ප්‍රධාන පරිසර කලාප දෙකක් නම් කරන්න. (ලකුණු 02)

( ii ) පූර්ව ඓතිහාසික යුගයේ ජනාවාස වල දක්නට ලැබෙන මූලික ලක්ෂණ හතරක් ලියන්න. (ලකුණු 04)

( iii ) පූර්ව ඓතිහාසික යුගයේ මානවයාගේ සංස්කෘතික ලක්‍ෂණ (අවමංගල්‍ය චාරිත්‍ර) පිළිබඳ ව කරුණු දෙකක් ඇසුරින් පෙන්වා දෙන්න. (ලකුණු 05)

( iv ) මුල් ඓතිහාසික යුගයේ ජනාවාස වල දක්නට ලැබුණු මූලික ලක්‍ෂණ හතරක් ලියා ඉන් එකක් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(04). ( i ) පහත a,b,c හි සඳහන් කාර්යන් ඉටු කර ගැනීම සඳහා භාවිත කරන වාරි තාක්‍ෂණික අංගය ඉදිරියෙන් ලියන්න.

a) ගංගාවක ජලය වෙනත් ප්‍රදේශයකට ගෙනයාම සඳහා ඉදි කර ඇති බැම්ම -

b) වැව් බැම්මට ඇති වන පීඩනය අවම කිරීමට වැව් බැම්මට පිටුපස සදා ඇති හතරැස් ළිඳක ආකාරයේ නිර්මාණය -

c) වැවට ජලය එකතු වීමට පෙර අපද්‍රව්‍ය, රොන්මඩ ආදිය රඳවා ගැනීම - (ලකුණු 03)

( ii ) පහත සඳහන් වැව් ඉදි කරන ලද රජවරුන් ඉදිරියෙන් ලියන්න.

P - පරාක්‍රම සමුද්‍රය - Q - මින්නේරි වැව -

R - කලා වැව - S - ගිරිතලේ වැව - (ලකුණු 04)

( iii ) පූර්ව ඓතිහාසික යුගයේ මානවයා තාක්‍ෂණය (යකඩ) භාවිතා කල බවට ලැබී ඇති සාක්ෂි දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 05)

( iv ) '' වසභ රජුගේ ''දේශපාලන හා අර්ථික වැදගත්කම කරුණු තුනක් ඇසුරින් පැහැදිලි කරන්න (ලකුණු 06)

(05). ( i ) පහත සඳහන් කාර්යයන් සඳහා රජවරුන් විසින් පනවා තිබූ බදු වර්ග ඉදිරියෙන් ලියන්න.

( i ) හේන් වගා කිරීම සම්බන්ධ බදු -

( ii ) වැව්වල ජලය භාවිතා කිරීම සම්බන්ධ බදු -

( iii ) රජුට අයත් ඉඩම් වගා කිරීම සම්බන්ධ බදු - (ලකුණු 03)

( ii ) පැරණි යුගයේ ජල කළමණාකරණය සම්බන්ධයෙන් භාවිතා කළ පහත සඳහන් ක්‍රමවේද මඟින් ලැබෙන ප්‍රයෝජන දෙක බැගින් ලියන්න.

(a) ඌරාකැට ළිං - (b) එල්ලංගාව - (ලකුණු 04)

( iii ) ''පැරණි රජවරු වෙළඳාම සම්බන්ධයෙන් ඒකාධිකාරී බලයක් මෙන්ම දැඩි නීති රීති පද්ධතියක්ද ක්‍රියාත්මක කර ඇත.'' හේතු දෙකක් ඇසුරින් පහදන්න. (ලකුණු 05)

( iv ) අතීතයේ රජවරු පරිසර අලංකාරය සඳහා හා ආරක්‍ෂාව සම්බන්ධයෙන් කටයුතු කළ ආකාරය උදාහරණ තුනක් ඇසුරින් පහදන්න. (ලකුණු 06)

(06). ( i ) රාජධානී නිරිතදිගට සංක්‍රමණය වීමත් සමගම ආරක්ෂිත බලකොටු පිහිටුවා ගත් ප්‍රාදේශීය පාලකයන් වරහන් තුළින් තෝරා අනුපිළිවෙළින් ලියන්න.

A - යාපහුව - B - ගෝවින්ද මලය - C - ගංදෙණිය - (ලකුණු 03)

(සංඛ සෙනවි, සපුමල් කුමරු, සුභ සෙන්පති, කිත්ති විජයබාහු, බුවනෙකබාහු ආදිපාද)

( ii ) රාජධානී නිරිතදිගට සංක්‍රමණය වීමට බලපෑ හේතු හතරක් ලියන්න. (ලකුණු 04)

( iii ) දෙවන නාගරිකරණ සමයේ ආර්ථික ක්‍රමයේ දක්නට ලැබුණු ලක්ෂණ දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 05)

( iv ) පැරණි ලාංකිකයන් දේශීය ආර්ථික රටාවෙන් මිදීමට අකමැති වු අතර ඒ පිළිබඳ දැඩි උනන්දුවක් ද දක්වා ඇත.'' උදාහරණ තුනක් ඇසුරින් පහදන්න. (ලකුණු 06)

(07). ( i ) උඩරට රාජධානිය ඇසුරින් පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු පසයන්න.

a) උඩරට රාජධානිය හැඳින්වීමට භාවිතා කළ නමක් -

b) උඩරට රාජධානියට ස්වාභාවික ආරක්ෂාව සැපයූ දූර්ගයක් -

c) උඩරට රාජධානියේ ආරම්භක පාලකයා (ලකුණු 03)

( ii ) පහත සඳහන් නම් වලින් හඳුන්වන ලද පුද්ගලයන් වරහන් තුළින් තෝරා ලියන්න.

a) දොන් පිලිප් - b) දොන් ජුවන් -

c) I රාජසිංහ - d) දෝන කතිරිනා -

(ටිකිරි කුමරු, කුසුමාසන දේවිය, තලතා දේවිය, යමසිංහ බණ්ඩාර, කොනප්පු බණ්ඩාර, වීදිය බණ්ඩාර) (ලකුණු 04)

( iii ) උඩරට රාජධානියේ ආර්ථික කටයුතු පිළිබඳව කරුණු දෙකක් ඇසුරින් පහදන්න. (ලකුණු 05)

( iv ) I විමලධර්මසූරිය රජුගේ වැදගත්කම කරුණු තුනක් ඇසුරින් පහදන්න . (ලකුණු 06)

## III කොටස

(08). ( i ) පහත සඳහන් යුරෝපා ජාතීන් මෙරටට ගොඩබසින ලද වරායන් වරහන් තුළින් තෝරා ලියන්න.

1) පෘතුගීසීන් - b) ලන්දේසීන් -

c) ඉංග්‍රීසීන් -

( කොළඹ, කල්පිටිය, මාගම, මඩකලපුව, මන්නාරම, ත්‍රිකුණාමලය, දඹකොල පටුන ) (ලකුණු 03)

( ii ) යුරෝපා ජාතීන් දේශ ගවේෂණය සඳහා පෙළඹ වු සාධක හතරක් ලියන්න. (ලකුණු 04)

( iii ) පෘතුග්‍රීසින් හා උඩරට රාජ්‍ය අතර ගැටුම් නිර්මාණය වූ ප්‍රධාන අවස්ථා දෙකක් විස්තර කරන්න.

( iv ) යුරෝපා ජාතීන්ගේ පැමිණීම ශ්‍රී ලංකාවේ දේශපාලන හා සමාජ ක්ෂේත්‍රයට සිදු කළ බලපෑම පැහැදිලි කරන්න. (ලකුණු 06)

(09). ( i ) පුනරුදය සම්බන්ධයෙන් පහත සඳහන් ප්‍රශ්න වලට අදාළ පිළිතුර ඉදිරියෙන් ලියන්න.

a) පුනරුදය ආරම්භ වූ -

b) පුනරුදයට මග පෑදූ ආගමික යුද්ධය -

c) පුනරුදයේදී ඉතාලියේ චිත්‍ර වලට ප්‍රසිද්ධ නගරය - (ලකුණු 03)

( ii ) පුනරුදය ඇති වීමට බලපෑ හේතු හතරක් ලියන්න. (ලකුණු 04)

( iii ) පුනරුදය යුරෝපයේ කලාශිල්ප ක්ෂේත්‍රය තුළ සිදුකළ වෙනස්කම් දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 05)

( iv ) i) පුනරුදය නිසා යටත් විජිත පිහිටුවාගත් රටවල් දෙකක් නම් කරන්න.

ii) දේශ ගවේෂණයට අනුග්‍රහ දැක්වූ රාජ්‍ය නායකයන් දෙදෙනෙක් නම් කරන්න.

iii) පුනරුදය නිසා විද්‍යාත්මක ක්ෂේත්‍රයේ සිදුවූ නව සොයාගැනීම් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 06)

* * * * * * *

සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

10 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2019 | 33 | S | I

ඉතිහාසය - II | **History - II** | வரலாறு - II | කාලය පැය තුනයි

(අ) - I | **(A) - II** | அ - I



සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved



10 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2019 | 33 | S | I

ඉතිහාසය - II **History - II** வரலாறு - II කාලය පැය තුනයි

(අ) - I (A) - II அ - I



වර්ෂ අවසාන පරීක්ෂණය
10 ශ්‍රේණිය
ඉතිහාසය

1 වන පත්‍රය

| ප්‍රශ්න අංක | පිළිතුර | ප්‍රශ්න අංක | පිළිතුර | ප්‍රශ්න අංක | පිළිතුර | ප්‍රශ්න අංක | පිළිතුර |
|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 11 | 1 | 21 | 4 | 31 | 3 |
| 2 | 2 | 12 | 3 | 22 | 1 | 32 | 1 |
| 3 | 4 | 13 | 2 | 23 | 3 | 33 | 4 |
| 4 | 4 | 14 | 3 | 24 | 3 | 34 | 2 |
| 5 | 3 | 15 | 4 | 25 | 4 | 35 | 1 |
| 6 | 3 | 16 | 1 | 26 | 3 | 36 | 2 |
| 7 | 2 | 17 | 4 | 27 | 2 | 37 | 4 |
| 8 | 1 | 18 | 2 | 28 | 1 | 38 | 4 |
| 9 | 3 | 19 | 1 | 29 | 4 | 39 | 1 |
| 10 | 4 | 20 | 2 | 30 | 2 | 40 | 1 |

ලකුණු 1x40=40

II පත්‍රය I කොටස

01. අ) i ලංකා සිතියම (ලකුණු 1x12=12) ii.ලෝක සිතියම (ලකුණු 1x6=6)
ආ) . A වලගම්බා රජතුමා B. ෆ්‍රැන්සිස්කු ද අල්මේදා
C. විජය කුලංකෙයි ආර්යය චක්‍රවර්ති/ ආර්යය චක්‍රවර්ති D. ඉබන්බතූතා (ලකුණු 1x4=4)
ii.A. ටොලමි/ ග්‍රීක ජාතික ටොලමි B. ලංකා සිතියම ඇඳීම/ ලෝක සිතියම ඇඳීම
C. ග්‍රීක/ ග්‍රීක රෝමානු D. භූගෝල ශාස්ත්‍ර ප්‍රවේශය (ලකුණු 1x4=4)
iii. A. මැටි බඳුනක්/ මැටි බඳුනක කොටසක්/ පින්තාරු කල මැටි බඳුනක්/ උඩරංචා මඩමනිවසෙන් හමු වූ මැටි බඳුන B. උඩරංචා මඩම නිවසෙන් C. පූර්ව ඓතිහාසික යුගයට D. සකපෝරුව

II - කොටස (ල.1x4=4)

02. i. a. කාසි (තඹ කාසි, අක නම් රන් කාසිය, කහවණුව, මස්ස, අඩමස්ස.... ආදී ඕනෑම පැරණි කාසියක් නම් කර තිබේ නම්)
b. සන්නස් කැටයම්, රන්පත්, මැටි පුවරු, බිත්ති, තඹ තහඩු ආදියේ ලියා ඇති කොටා ඇති, ඇඳ ඇති ලේඛනයක් නම් කිරීම උදා: වල්ලිපුරම් රන්පත, ඇම්බැක්කේ ලී කැටයම්, පනාකඩුව තඹ සන්නස, ශිලා ලිපි ආදී
c. ආගමික නොවන නටබුන් (උදා: මාලිගා, වැව්, පොකුණු, මණ්ඩප, ප්‍රතිමා ආදී නම් කිරීම උදා. පරාක්‍රමබාහු රජුගේ මාලිගය/සීගිරිය ආදී (ලකුණු 1x3=3)
ii. තමා ජීවත්වන ලෝකය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට/ජාතික සමගිය ගොඩනැගීමට/විවිධ මත ඉවසීම /අන් සංස්කෘතීන්ට ගරු කිරීමට/කාලය හා අවකාශය අතර අදහස් වර්ධනයට/තේරුම් ගැනීමට/අතීත අත්දැකීම් අනුව වර්තමානය තේරුම් ගෙන අනාගතය ගොඩනැගීමට (ලකුණු 4)
iii. මූලාශ්‍රය රචනා වූ කාලය/මූලාශ්‍රයේ කතුවරයා/කතුවරයාගේ අරමුණු/මූලාශ්‍රයට කරුණු සපයාගත් ආකාරය (මේ පිළිබඳ සැලකිලිමත් විය යුත්තේ ඇයිදැයි විස්තර කර තිබිය යුතුයි) (ලකුණු 5)
iv. එම රට හා බැඳි - සංස්කෘතික සබඳතා අධ්‍යයනයට /සංක්‍රමණ/ ආක්‍රමණ/ විදේශ සබඳතා/ දූත ගමන්/ වෙළෙඳ සංචාරකයන් ලෙස පැමිණි පිරිස් හා පැවති සබඳතා අධ්‍යයනයට ආදී උදාහරණ ඇසුරින් පැහැදිලි කිරීම (ලකුණු 2x3=6)

03.i. a. හෝමෝ සාපියන් (ලකුණු 1)
b. අර්ධ ශුෂ්ක කලාපය/පහතරට වියලි කලාපය/පහතරට අතරමැදි වියලි කලාපය/තෙත් කලාපය/කඳුකර වියලි අතරමැදි කලාපය/ශුෂ්ක කලාපය (මින් ස්ථාන 2 ක් නම් කිරීම සඳහා) (ලකුණු 2)
ii. යකඩ ලෝහ භාවිතය/ස්ථිර වාසීතාවය/නිවාස තාක්ෂණය/මැටි වලං තාක්‍ෂණය/කෘෂිකර්මාන්තය මත පදනම් වීම හා ශාක ආහාර මත වැඩි නැඹුරුව (ලකුණ 4)
iii. මහා ශිලා සුසාන ක්‍රම භාවිතය/ශිලා මංජුසා සොහොන් භාවිතය/මැටි ඔරු සුසාන ක්‍රමය හා චාරිත්‍ර පිළිබඳ විස්තර කිරීම (ලකුණ 5)
iv.. වාපි ගම් බිහිවීම (උදා: සුන්දරවාපී/කඩහවාපි/සුමනවාපි/විහාරවාපි) /කර්මාන්ත අනුව ගම් බිහිවීම (උදා: කේවට්ට ගාම, වඩ්ඩග ගාම, ඔලගම්, කාසිකාරගාම, මනිකාරගාම, කුම්භකාර ගාම)/ගංගාවලින් පිටත ගම් බිහිවීම/ගම, නගරය හා පුරවරය දක්වා දියුණු වීම/කෘෂිජීවන රටාව/පරික්ඛිත ගම් හා අපරික්ඛිත ගම් ලෙස පැවතීම/කාලීන ක්‍රමයක් පැවතීම (ලකුණු 4+2=6)

04. i. අමුණ b. බිසෝකොටුව c. කුළු වැව (ලකුණ 3)
ii. P පරාක්‍රමබාහු රජතුමා Q. මහසෙන් රජතුමා R. ධාතුසේන රජතුමා S. II අග්ගබෝධි රජතුමා(ලකුණ 4)
iii. බෙරගලින් යබොර කැබැල්ලක් හමුවීම/බලංගොඩ සමනල වැව යකඩ නිස්සාරණ ක්‍රමය/සීගිරිය දෙහිගහ ඇල කන්ද යකඩ නිස්සාරණය ක්‍රමය /උඩරංචා මඩම නිවසෙන් හමු වූ ඇස් අඳුන් ගල්වන ලෝහ කූර පිළිබඳ විස්තර කිරීම (ලකුණ 5)
iv <u>දේශපාලනය</u>- දිවයින පුරාම රජුගේ බලය ව්‍යාප්තව පැවතීම. ( උදා : යාපනයේ සෘෂිගිරි ඇමතිවරයෙක් යටතේ පාලනය වීම / වල්ලිපුරම් රන් සන්නස )
-ශ්‍රී ලංකාවේ අය බදු ක්‍රමය ක්‍රමවත් කිරීම/ආගමික හා දේශපාලන ලෙස සහනශීලී ප්‍රතිපත්තිය
-ලම්භකරණ වංශයේ ආරම්භක පාලකයා වීම.
<u>ආර්ථික</u> -විශාල වැව් ඉදිකිරීමේ ආරම්භකයා වීම ( උදා: වැව් 11 හා ඇළවල් 12 ක්) / ඉන්දියාවේ ක්‍රිෂ්ණ නදී තීරයේ ආහාර හිඟයට පිළියමක් ලෙස වාරි කර්මාන්තය හා කෘෂිකර්මාන්තය නඟා සිටුවීම/අයබදු එකතු කිරීම ප්‍රතිසංවිධානය කිරීම. (ලකුණ 6)

05) i. a. - කැති අඩ / කෙටු කනබ අය/b. - දකපති / උදක ප්‍රාප්ති/c. - බොජක පති / බෝජක ප්‍රාප්ති (ල.3)
ii. a. ජලයේ සිසිලස රැකීම / ප්‍රමිතිය ආරක්ෂා කිරීම/ජලයේ රොන් මඩ / විෂවායු වර්ග එකතු වීම වැළැක්වීම.
b. -වාරි ජල කළමනාකරණයට /කෘෂිකාර්මික කටයුතු සඳහා උපරිම ප්‍රයෝජනය ගැනීමට හා ප්‍රයෝජන පිළිබඳ සඳහන් වන පිළිතුරකට ලකුණු ලබා දෙන්න. (ලකුණු 2+2=4)
iii. විදේශ භාණ්ඩ ආනයනයේදී බදු අය කිරීම. ( උදාඃ සිතුල් පව්ව සෙල්ලිපිය)/අභ්‍යන්තර වෙළඳපල තත්වය සෙරබොර වැව ටැම් ලිපිය / බදුළු ටැම් ලිපිය/උදාඃ වෙළඳ පොළට එන අයගෙන් මිස පසු කර යන්නන්ගෙන් බදු අය නොකළ යුතු බව/තරාදි පඩි ප්‍රමිතිය පිළිබඳව/ බුලත් පුවක් විකිණීම පිළිබඳ/ පෝය දින වෙළඳම් කළ අයට දඬුවම් ලබා දීම. ආදී (ලකුණු 5)
iv. අමණ්ඩ ගාමිණී අභය රජු -මාඝාත නීතිය
IV වන මිහිදු රජු - මී හරක්, එළ හරක්, එළුවන් මැරූඅයට දඬුවම් ලබාදීම.
නිශ්ශංක මල්ල රජු - ජලාශවල ජීවත්වන පක්ෂීන් නොමැරිය යුතුය.
V වන මිහිදු රජු - උස් බිම් වල ඉඩම්වල කැලෑ නොකැපිය යුතුය ආදි උදාහරණ(ලකුණු 6)

06)i a) යාපහුව - සුභ සෙන්පති b) ගොවින්ද මලය - බුවනෙක බාහු ආදිපාද
c) මහියංගණය ගංදෙණිය / මිණිපේ - සංඛ සෙනවි. ( ල.03)
ii. - දුර්වල පාලකයින් බලයට පත්වීම.
- රජවරුන්ගේ රාජ්‍ය පාලන ක්‍රමය කෙටිවීම. (උදාඃ අවු.29 ක් තුළ පාලකයින් 12ක් පාලනය කර තිබීම.
- කාලිංග පාණ්ඩ්‍ය වංශිකයින් අතර ගැටළු ඇති වීම. - ආර්ථික පරිහානිය - ක්‍රි.ව.1215 - කාලිංග මාඝ ආක්‍රමණය - රජරට ආරක්ෂාව නැතිවීම- ජනතාව වෙනත් ප්‍රදේශවලට සංක්‍රමණය වීම. ( ලඃ 04)
iii. - කෘෂි කර්මාන්තය ප්‍රධාන වීම. - වී වගාව ප්‍රධාන වීම. - වාණිජ ආර්ථිකය නැඹුරුවීම - විදේශ වෙළඳාම රජුගේ ඒකාධිකරණය යටතේ පැවැත්වීම.
- අභ්‍යන්තර වෙළඳ පෙළ හා කඩවීදි පැවති බවට කුරුණෑගල විස්තරයේ සඳහන් වීම (උදාඃ ඉබන් බතුතාගේ පැමිණීම) - කුළු බඩු වෙළෙඳාම (ල.05)
iv - ප්‍රධාන ආහාරය බත් වීම / ප්‍රධාන ධාන්‍ය වර්ග 07 ක් වීම ( උඳු / මුං / තල / මෑ / අමු / මෙනේරි / යව ආදි - සුවඳ තෙලින් පිසූ මොනර මස් හා ඇල් හාල් බත්- කාඩි ඇඹුල / යාගු හෝ හම්බු - තිල සංගුලිකා - අල වර්ග ( වැල් අල / කුකුළල / ගෝණ ආදී ...) - එළවලු වර්ග - කැඳ වර්ග /කුළු බඩු / කිරි ආදි ආහාර වර්ග පිළිබඳව විස්තර කිරීම. (ලකුණු 6)

07) i) a. සෙංකඩගල/ මහනුවර/උඩරට/ කන්දේ නුවර b. බලන / හුන්නස්ගිරිය c. සේනා සම්මත වික්‍රමබාහු(ලකුණු 3)
ii. a) යමසිංහ බණ්ඩාර b) කොනප්පු බණ්ඩාර c) ටිකිරි කුමරු d) කුසුමාසන දේවිය (ලකුණු 4)
iii. 10 ශ්‍රේණිය පෙළ පොත - පිටු අංක 114 යටතේ දක්වා ඇති කරුණු 02ක් පැහැදිලි කිරීම (ලකුණු 5)
iv. උඩරට නව රාජවංශක ආරම්භකයා වීම/පෘතුග්‍රීසින්ගෙන් උඩරට රාජ්‍යය බේරා ගැනීම/උඩරට රාජ්‍ය උරුමය නීත්‍යානුකූලව උරුම කර ගැනීම/රෝමානු කතෝලික ආගම අතහැර බුදුදහම වැළඳගැනීම/දෙල්ගමුවේ සඟවා තිබූ දළදා වහන්සේ මහනුවරට වැඩම කරවීම/ක්‍රි. ව. 1594 දන්තුරේ හා 1602 බලන සටනක් ජය ගැනීම/ බුදු දහම නැවත නඟ සිටුවීම/ගොවිතැන දියුණු කිරීම/කපු වගාව, යකඩ වානේ කර්මාන්තය, වෙඩි ලුණු කර්මාන්ත දියුණු කිරීම (ලකුණු 6)

## III - කොටස

08. i. a. කොළඹ b. මඩකලපුව c. ත්‍රිකුණාමලය/ගෝකන්න (ලකුණු 3)
ii. පෙරදිගට පැමිණීමට විකල්ප මාර්ග සෙවීමට/පුනරුදයේ ප්‍රතිඵලයක් ලෙස /ආගම ප්‍රචාරයට/අධිරාජ්‍ය වාදය ව්‍යාප්තියට/වෙළෙඳාම සඳහා/ජාතික රාජ්‍ය බිහිවීම හා රාජ්‍ය අනුග්‍රහය ලැබීම (උදාඃ පෘතුගාලය/ස්පාඤ්ඤය/ ඕලන්දය ආදී)/ත්‍රාසජනක අත්දැකීම් ලැබීමට/විද්‍යාත්මක ක්ෂේත්‍රයේ දියුණුව හා දැනුම වර්ධනය වූ නිසා (ලකුණු4)
iii. ක්‍රි.ව.1594 - දන්තුරේ සටහ / ක්‍රි. ව. 1602 - බලන සටන / ක්‍රි.ව 1630 රන්දෙණිවෙල සටන / ක්‍රි. ව. 1638 - ගන්නෝරු සටන මෙම සටන් සිදුකිරීමේ දී උඩරට පාලකයන් හා සටන මෙහෙය වූ පෘතුගිසි නිලධාරින් සඳහන් කරමින් විස්තර කර තිබීම (ලකුණු 5)
iv. දේශපාලන, රාජාණ්ඩු ක්‍රමය බිඳවැටීම - පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයක් පැමිණීම/වැඩවසම් සමාජය පිරිහීම - රදල බලය පිරිහීම / යටත් විජිත රාජ්‍යයක් වීම/ රෝම ලන්දේසි නීතිය ක්‍රියාත්මක වීම/නව අධිකරණ පද්ධතියක් ලැබීම
සමාජ ප්‍රතිඵල, මුද්‍රණ යන්ත්‍රය භාවිතා වීම නිසා දැනුම පුළුල් වීම /බටහිර අධ්‍යාපන ක්‍රමය/සංස්කෘතිය පැවතිම /රෝමානු කතෝලික ආගම ව්‍යාප්ත වීම/සංස්කෘතිය භාෂාව/ඇඳුම් පැළඳුම්/ආහාර රටාව/සිරිත් විරිත් සම්මිශ්‍රණය වීම (ලකුණු 6)

09. i. a. ඉතාලිය b. කුරුස යුද්ධය c. ෆොලෝරන්ස් නගරය (ලකුණු 3)
ii. a. කොන්ස්තන්තිනෝපල් නගරය තුර්කින්ට යටත් වීම/වැඩවසම් ක්‍රමය බිඳ වැටීම/දේව වරම්වාදය යටපත් වී මානව වාදය ඉස්මතු වීම /සාගත හා වසංගත රෝග ඇති වීම/බුද්ධි ප්‍රබෝදය, වෙළඳාම දියුණුව ආදි ..... (ල.4)
iii. ස්වාධීනව තම දක්ෂතා එළිදැක්වීම/ආගමික සිතිවිලිවලට මුල්තැන දීම වෙනුවට පෞද්ගලිකත්වයට හා ලෞකික රස වින්දනයට මුල්තැන දීම/ශ්‍රේණි නමින් එළි දැක්වූ කලා කෘති පුද්ගල නාමයන් එළි දැක්වීම/ ධනවතුන් කලාකරුවන්ට අනුග්‍රහ දැක්වීම/දේවවරම් වාදය බිඳවැටී මානව වාදය ඉස්මතු වූ කලාකෘති දක්නට ලැබිම. (ලකුණු 5)
iv. 1. පෘතුගාලය, එංගලන්තය, ප්‍රංශය, ස්පාඤ්ඤය නෙදර්ලන්තය යන රටවල් ආදී... (ලකුණු 2)
2. නාවික හෙන්රි - පෘතුගාලය/ෆර්ඩිනන්ඩ් හා ඉසබෙලා - ස්පාඤ්ඤය (ලකුණු 2
3. එක් විෂය ක්ෂේත්‍රයකට සීමා නොවී කටයුතු කළ බව, ඒ අතර නිකලස් කොපර්නිකස්/ ජොහැන්නස්කෙප්ලර්/අයිසැක්නිව්ටන්/විලියම් හාර්වේ/වෛද්‍ය පැරසල්පස්/මයිකල් සර්වෙටස්/ජොහැන්ස් ගුටෙන්බර්ග් යන විද්වතුන් විසින් සපයා ගත් නව සොයා ගැනීම් විස්තර කළ යුතුයි (ලකුණු 2)



අ (1) / அ (1) / A (1)
ඉතිහාසය II / History -II / வரலாறு II
දඹකොල පටුන
ඉරණමඩු වැව
සීගිරි පොකුණ
පොළොන්නරුව
මඩකලපුව
මාගම
මහතිත්ථ
මල්වතු ඔය
කල්පිටිය
කෝට්ටේ




අ (II) / அ (II) / A (II)
N.
බ්‍රිතාන්‍ය
රෝමය
කොන්ස්තන්තිනෝපලය
මධ්‍යධරණී මුහුද
Mediterranean Sea
රතු මුහුද
Red Sea
පර්සියන් බොක්ක
කැලිකට්
මලක්කා සමුද සන්ධිය
අප්‍රිකාව
Africa
ඉන්දියන් සාගරය
Indian Ocean